# සෝමවතී චෛත්‍යයේ ශිලා ලිපි

පුරා විද්‍යා කොමසාරිස්
ආචාර්ය සද්ධාමංගල කරුණාරත්න විසිනි.

මේ චෛත්‍යය හා වට භූමි භාගය පුරාවිද්‍යා රක්ෂිත භූමියක් ලෙස 1967 ජූලි 07 වන දින ගැසට් නිවේදනයකින් පත් කරන ලදී. මේ රක්ෂිත ඉඩම් පිහිටා තිබෙනුයේ රජරට සීමාව තුලය. සෑ බිමේ පසෙකින් මහවැලි ගඟ නිසලව ගලා බසී. සෑය වටා විහිදී ඇති තැනිතලා බිම රමණීය දැකුම්කලු දර්ශනයක් උද්වහනය කෙරේ.

විහාර භූමියෙහි ශිලා ලිපි දෙකක් දක්නට ලැබේ. පුවරු ලිපි වූ ඒ දෙකෙන් එකක් කෙටිය. අනික දිගුය. කෙටි ලිපිය හමුවූයේ සෑ මලුවෙහිය. දීර්ඝ ලිපිය සොයා ගන්නා ලද්දේ චෛතියංගනයට මදක් ඈතින්ය.

දිගු සෙල් ලිපිය වූ කලි 1953 දී අපට හමු වූවෙකි. අප මේ ලිපිය සොයාගත් අවස්ථාවේදී සෝමවතියට යෑමට මඟක් නොවී, එකල වන සතුන් ගෙන් ගහන වූ පෙදෙසක් වූ හෙයින් මෙය පිටපත් කිරීමට ගිය අවස්ථාවේදී නොයෙක් කම්කටොලු වලට මුහුණ දෙන්නට සිදුවුනි. මේ ලේඛන දෙක පිළිබඳ විස්තර පහත සඳහන් වේ.

සෝමවතිය දාගැබට නුදුරින් වූ මීන්විල විශාල ගල් පරයෙහි එරික් ස්වෝන් නැමැති සුප්‍රකට ඡයාරූප ශිල්පියා වල් අලියෙකුගේ පහරින් මරු මුවට පත් වූයේ මේ ගල සමීපයෙහි බැවින් ඔහුගේ නමින් මේ ගල අද හැඳින්වේ. ශිලා ලිපි හතරක් මේ ගලෙහි කොටා තිබෙනු දක්නට ලැබේ.

සෝමවතියෙත්, එරික් ස්වෝන් ගලෙත් ඇති ලිපි අතුරින් වැදගත් ලිපිය ලෙස සැලකිය හැක්කේ සෝමවතියේ විශාල පුවරු ලිපියයි. එහි කොටා ඇත්තේ කනිට්ඨ තිස්ස රජු (ක්‍රි.ව. 164-192) ගෙන් මණි අගිය විහාරයට වූ ප්‍රදානයෙකි.

එහි දක්නට ලැබෙන 'රජ-අඩි-පිටිය' යනු මීන්විල ලිපියෙහිද හමුවේ. එක් කලෙක මේ විහාරයට ලැබුණු ආදයම ඇනහිටින්නට ඇතැයි සිතිය හැකියි. එහෙයින් යළිත් වරක් එවැනි ඇනහිටීමක් නොවනු සඳහා දඩයක් නියම කොට තිබේ. තොටුපොලවල් තුනකින් ලැබුනු ආදයම මේ සංඝාරාමයේ දියුණුව සඳහා යොදා ඇත. තවද සඟ සතු ඉඩම් වල පදිංචිකාරයන්ට විහාරයේ උපෝසථාගාරය ආරක්ෂා කිරීමෙහි යෙදෙන ලෙස නියම කොට තිබේ.



ඒ ලිපියෙහි පෙළ පහත දැක්වේ.

## පළමුවන ලිපිය

1. සිධ 1 නක මහරජහ පුත බතිය තිස මහරජහ මළිතිස මහරජ් රජ
2. (අළි) විටිය හවිටික සරහි මණි අගිය රජ මහ විහර අකඩ සඟ අරබ කර
3. වය වහිරහි සවන - වටනකෙ කොටි මෙ වහරහි සවිත සවණ චලනය නොලබනකෙහි
4. මෙහි යවනය කහ(වණ) ගනිය චෙතහි ච පොහොතරහි (පි)ණ පඩිසතරි
5. ය නවකම කරනකහි පිණපටිසතරිය නවකම නෙති හොත බුකෙ සහ (හටයප) කව
6. ටහි ඔවනකහි මෙ විහරහි සවිත සවණ චලන දඩ පච සත මෙ සඟ අරබ.
7. පොහාතකරහි වටි තෙල මුල කොටු පිණ පටි සතරිය නවකම මුල කොටු අතරගගහි.
8. කෙහිගම තොටි ච සුමනත - ගමත තොටි ච තොටගමක තොටි ච මෙ තිණි තොටි දිනි.
9. මෙ රජ මහ විහරහි මණි අගිය පොහොතකරහි අරක නිවිද කට වටනක බවිනි මෙ වෙහෙර.
10. අසනක සඟ බොගගි වසන කුලෙ මහ අවරහි බලි කඩය වෙහෙරහි අරකෙහි දනෙකෙහි.

ලිපියෙහි තේරුම මෙසේ දැක්විය හැකිය.

යගපතක් වෙවා.

නාග නමැති මහ රජුගේ පුත්‍රයා වූ ද භාතිය තිස්ස නමැති මහරජු ගේ කනිටු සොහොයුරු වූද තිස්ස නමැති මහරජ අලි විටියෙහි හවිටක වැව සමීපයෙහි වූ මණි අගිය නමැති රජ මහ විහාරයෙහි සංඝාරාමයක් නැවත පිහිටුවා යථෝක්ත විහාරය වෙනුවෙන් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රකාශනය (කල් යෑමේ දී) ක්‍රියාවේ නොයෙදීම හේතු කොටගෙන මේ ස්ථානයට (ලැබීමට නියමිත) ආදයම නොලැබෙන අවස්ථාවේදී - මෙබඳු නියෝගයක් පනවන ලදී. මේ ආඥවට අනුව මේ විහාරයට ලැබිය යුතු කහවණු ලබාගෙන ඒ මුදල යෑයේත් පෝයගේත් ප්‍රතිසංස්කරණය කිරීමට නව කර්මාන්ත වැඩ සඳහාද (යෙදිය යුතු වන්නේය).

ප්‍රතිසංස්කරණ වැඩ කිරිමට ද නව කර්මාන්තයටද වුවමනා නොවන්නේ නම් මේ ආදයම සංඝයා වෙත දනය සැපයීම සඳහා දිය යුතුයි.

මේ විහාරය සඳහා පනවා ඇති ආඥව පිළි නොපැදීමේ වරදට දඬුවම කහවණු පන්සියයකි.

මේ විහාරයේ උපෝසථාගාරයේ පහන් දැල්වීම සඳහා තෙල් සැපයීමට ද කටුකොහොල් ඇරීමටද, ප්‍රතිසංස්කරණය කිරීමටද මේ තොටුපොලවල් තුන - එනම්, අතරගගහි කෙහිගම තොටුපොල ද, සුමනතගම තොටුපල ද, තොටගමකහි තොටුපල ද දෙන ලදී.

මණි අගියේ උපෝසථාගාරයෙත් රජමහ විහාරයෙත් ආරක්ෂාව සැලසීම නිශ්චය කළ යුතු තිබෙන හෙයින් මේ විහාරයට හිමි සඟසතු ඉඩම්වල පදිංචි පවුල්වල අය මහ වෑකණ්ඩියේ වැඩවලින් මුදවා විහාරය රැකීමේ කාර්යයෙහි යෙදිය යුතුව තිබේ.

සෝමවතී චෛත්‍ය මලුවේ තිබී තවත් ශිලා ලිපියක් 1940 දී සොයා ගන්නා ලදී. එය පේළි සතරකින් සමන්විත වූවෙකි. දැනට එය චෛත්‍යයට නැගෙනහිරින් සිටුවා තිබෙනු පෙනේ. මේ ලිපියෙන් දැක්වෙනුයේ මහනක නමැති රජුගේ පුතකු වූ නකෙල නමැති කුමරා විසින් පජින නක අරබ (ප්‍රාචීන නාගාරාමය) පිහිටුවීමයි. මෙහි මහ නක නමින් හැඳින්වෙන්නේ දුටු ගැමුණු රජුගේ මුණුපුරා වන මහාදඨික මහානාග රජුය. (ක්‍රි.ව. 9 - 12)

ඒ ලිපියෙහි පෙළ මෙසේ කියැවේ.



## දෙවන ලිපිය

1. සිද්ධම් මහනක රජහ පුත අය නකෙල න
2. මෙ පජිහි නක අරබ විහර කරතෙ මහ නක රජ
3. තුමහ පුතහ විහරහි උපදරිනි විහරහ
4. කෙතනහි රජලි කෙතහි කරිහි සතක සඟ බකි දිනි.

මෙහි ගැබ් වී ඇති අදහස මෙසේ දක්වනු කැමැත්තෙමු. යහපතක් වේවා ප්‍රාචීන නාගාරාමය, මහානාග රජුගේ පුත්‍ර වූ නාග නමැති කුමාරයා විසින් පිහිටුවනු ලදී. මහානාග රජු, තම පුතුගේ විහාරයේ නඩත්තුව සඳහා තත් විහාරය අබියසෙහි වූ රජලි නමැති කුඹුරෙන් සත් කරීසක්, සඟ සතුකොට දෙන ලදී.

මේ සෙල් ලිපියෙන් විස්තර වන්නේ පාචීන නාගාරාමය පිහිටුවීමයි. 'පජින නක අරබ' යන නමින් සෙල් ලිපියෙහි සඳහන් වී ඇත්තේ මේ විහාරය පිහිටුවා ඇත්තේ නකෙල නමැති කුමරෙකු විසිනි. ඔහු මහා නාග රජුගේ පුත්‍රයෙකැයි සඳහනි.

මෙයට යටින් අප දක්වා ඇති මීන්විල ලිපියෙහි ද මේ 'පජින නකල අරබ' විහාරය ගැන කියැවේ. යථෝක්ත විහාරයට ගමක් පිදීම ඒ ලිපියෙන් ප්‍රකාශ කරනු ලැබේ. නක මහරජ ගැනද ඔහු ගේ පිත් නකල කුමාරයා ගැනද සඳහන් වේ. මේ ලිපි දෙකෙහිම සඳහන් වී ඇති පාචීන නාගාරාම විහාරය - එකම ස්ථානය යැයි විශ්වාස කළ හැකියි. මේ ලිපියෙහි එන නක මහරජ වූ කලි මහාදඨික මහ නාග (ක්‍රි.ව. 9-21) රජු යැයි විශ්වාස කළ හැකිය. බුදුරජාණන් වහන්සේගේ ඌර්ණ රෝම ධාතූන් වහන්සේ, නිදන් කොට මිහින්තලේ මහ සෑ තනන ලද්දේ මේ රජු විසිනි.

නකල කුමාරයා ගැන මහා වංශයෙහි හැඳින්වීමක් පෙනෙන්නට නැත. මොහු මහාදඨික මහානාග රජුගේ (ක්‍රි. ව. 9- ක්‍රි.ව. 21) පුත්‍රයෙකැයි ඉතිහාසඥයෝ අනුමාන කරති.

'පජින නකල අරබ' විහාරය පිළිබඳ මීන්විල ලිපියේ එහි පෙළ පහත සඳහනි.

## තෙවන ලිපිය

සිද්ධ නක මහරජ අඩි පිටිය තුමහ පුත අය නකලයහ කරිත පජි (න) නකල අරබ විහරටය දිනේ.

සැකෙවින් මෙහි අනුවාදය මෙසේයි,

යහපතක් වේවා. නාග නමැති මහරජ, තම පුත් නකල නමැති කුමාරයා විසින් පිහිටුවන ලද පාචීන නාගාරාම විහාරයට රජ අඩි පිටි නමැති ගම ප්‍රදානය කෙළේය.

මීන්විල ලිපි අතුරින් කෙටිම ලිපිය දක්වනු කැමැත්තෙමු. එහි පෙළ, දෙපෙළකින් යුතුය.

### සිවුවන ලිපිය

1. දෙවනපිය කුලහි මහවුඩිකහ පුත
2. පුටකණ අබයස අඩි දෙගම

දේවානම්පියතිස්ස පරම්පරාවෙන් පැවත එන මහවුළි ගේ පුතා වූ කුටකණ අභයගේ දෙගම නමැති දිය ඇල මේ ලිපියෙන් කියැවේ. කුටකන අබය යනුවෙන් දක්වා ඇත්තේ කුටකණ්ණ තිස්ස (ක්‍රි.පූ. 41-19) රජුය.

මීන්විල වෙනත් ලිපියෙකැයි-මණි අගිය නමැති විහාරයට කරන ලද පිදීමක් ගැන පැවසේ. ඒ පූජාව පවත්වා ඇත්තේ 'යුදපි ගාමිණී අභය' මහරජු විසිනි. යුදපි යන විරුදය 'ගාමිණි අභය' ට සම්බන්ධ කොට තිබෙනු පෙනේ. එහෙයින් මෙය පළමු වන ගජබාහු (ක්‍රි. ව. 112-134) රජුගේ කෘතියෙකැයි විශ්වාස කළ හැකිය.

පෙළත් අනුවාදයත් පහත පළවේ.

## පස්වන ලිපිය

1. සිද්ධ (ම) හරජ ගාමිණී අබය යුදපි
2. (රජ අ) ඩිය ගම අය මණි (අගිය විහරට) දිනි.



සංග්‍රාමයේ විජයග්‍රාහක වූ ගාමිණී අබය මහරජු විසින් රජ ඇලෙහි පිහිටි ගමේ ආදායම, මණි අගිය විහාරයට දෙන ලදී.

එරික් ස්වෝන් ගලේ එක ලිපියක් විනාශයට පත්ව ඇත. ආමණ්ඩගාමිණී අභය (ක්‍රි.ව. 22-31) රජුගේ ලිපියකැයි අනුමාන කළ හැක.

## සවන ලිපිය

1. දෙව(නපි)ය පුටකණ අබ (ය මහ) රජහ (මරුමනක) (න)ක මහරජහ පුත දෙව
2. (නපිය'ගමිණි) අබ මහරජි

තේරුම :-

දෙවියනට ප්‍රියවූද පුටකණ අභය නමැති මහරජුගේ මුණුපුරා වූද නාග නමැති මහරජුගේ පුත්‍රයා වූද ගාමිණී අභය නමැති මහරජ

සෝමවතියේ මීන්විල පව්වෙහි කොටා ඇති ලිපි හයෙහි කීප පොළක, ''පජින නක අරබ'', ''මණි අගිය විහර'' සටහන් වී ඇත. එයින් දැක්වෙන්නේ එකම ස්ථානයක පිහිටි ගොඩනැගිලියැයි අනුමාන කිරීමට සිත මෙහෙයවනු ලැබේ. කුටකණ්ණ තිස්ස, මහාදාඨික මහානාග, පළමුවන ගජබාහු, කණිට්ඨ තිස්ස ආදී නරපතියන්ගේ නම්, මේ ලිපි තුලින් මතු වන හෙයින් මෙහි ඇත්තේ මුල් යුගයට අයත් ගොඩනැගිලිය. නටබුන් අතර වූ ගරා වැටුණු චෛත්‍යය - සෝමවති චෛත්‍යවර්ධන කමිටුව මඟින් ප්‍රතිසංස්කරණය වී - ජනාධිපති තුමන් අතින් කොත් පැළඳවීමේ පිංකමට සූදානමින් සිටී. (''බුදුරැස් විහිදෙන සෝමවතිය'' 1981 ජූලි 04 දින සෝමවතී චෛත්‍යරාජයාගේ කොත් පැළඳවීමේ උත්සවයේ සමරු කළඹින් උපුටා ගන්නා ලදී.)

## 7 වන ලිපිය

සෝමවතී චෛත්‍යරාජයා අභියස ඇති මීන්විල පර්වතයෙහි හෙවත් දිග් ගලෙහි (එරික් ස්වොන් ගල) ක්‍රි.ව: 164-192 දක්වා රජ කළ කණිට්ඨතිස්ස රජතුමා විසින් පිහිටුවා ඇති ''සිද්ධම් (නක) මහරජහ පුත

මලුතිස මහරප් අලිව්ටිය හව්ටක සරහි (අකඩ) සඟ - අරබ කරවය බව කිරිය - නකයෙහි (දි) නි''

යහපතක්ම වේවා. නක මහරජුගේ පුතා වූ, කණිට්ඨතිස්ස මහ රජතුමා අලිවිට් යෙහි හව්ටක (විල) වැව සමීපයෙහි සංඝාරාමය ප්‍රතිසංස්කරණය කරවා අභයගිරි නිකායික (භික්ෂූන් වහන්සේලාට) පූජා කරන ලදී.

## 𑇨 වන ලිපිය

එම මින්විල පර්වතයෙහිම කණිට්ඨතිස්ස රජතුමා විසින් පිහිටුවා ඇති පේළි 6 කින් යුක්ත ශෛල්ලිපිය ලෙස මෙම ග්‍රන්ථයෙහි 53 වෙනි පිටුවෙහි පළමුවන පුවරු ලිපිය ඒ අයුරින්ම කොටා ඇත. (එකම කරුණ පර්වත හා පුවරු වශයෙන් අභිලේඛන දෙකක් ලෙස හමුවේ. එවැන්නක් ස්ථාන දෙකක එකම ආයතනයක් තුළ මෙතෙක් හමුවී නැත.)

## 𑇩 වන ලිපිය

2002 ජුනි 01 දින සෝමවතී චෛත්‍යස්ථානය සමීප විහාර කැලයෙහි දර කැපීම සඳහා ගිය පිරිසකට හමුවී සුංගාවිල යුධ හමුදා කඳවුරට භාරදෙන ලද්දින් පොළොන්නරුව පුරා විද්‍යා ස්ථාන භාර නිළධාරි ඩී.ඇම්. පියතිලක මහතාගේද අනුදැනුම මත මා විසින් එම ලිපිය සොමවතී චෛත්‍යස්ථානයේ සෙල්ලිපි සුරැකිව තබා ඇති එලකහේ තැන්පත් කරන ලදී.

අඩි 4 අඟල් 4 ක් උස අඩි 1 අඟල් 4 ක් පමණ පළල ඇති පුවරු ලිපියක් වූ මෙම ලිපිය බු: ව: 1700 දී මහා පරාක්‍රමබාහු මහ රජතුමාගේ බිසව වූ ලීලාවතී බිසව දොළොස් දහස් රටින් ඇඹුල්පත් ගම පූජා කොට පිහිටුවා ඇත.

පසුගිය මාස කිහිපය තුළ සෝමවතී චෛත්‍ය සමීප විහාර කැලයෙහි තිබී නටඹුන් වූ විහාර හා චෛත්‍ය 18 ක් දැනට සොයාගෙන ඇත.

1. සුංගාවිල (මහවැලි ගඟේ සුංකම් අයබදු අයකළ ස්ථානයකි.) ගමේ සිට කිලෝමීටර 2 ක් පමණ ඈතින් සිංහල ගම්මානයක්වූ දේවාල



ගොඩැල්ලේ කුඹුරු යායක මායිමේ ගොඩනැගිලි දෙකක් සහිත මධ්‍යම ප්‍රමාණයේ චෛත්‍යයක් සහ මුරගල් සහිත ගොඩනැගිලි කිහිපයක ගල් පුවරු හා පොකුණක් හමුවී ඇත.

2. ජයබිම (සෝමවතී) කනිටු විදුහල අභියස මාර්ගයෙහි සමතලා වූ චෛත්‍යයක නටඹුන්, කුඹුරක ඉදිකර ඇති පොකුණක්, සිදුරක් සහිත ගල් පුවරු හා ඡත්‍ර ගල් සහිත භූමියක් හමු විය.

3. පෙරියාරු ගඟට නැගෙණහිරින් දකුණු ඉවුරේ සංඝබෝධිගම හරහා සෝමවතී චෛත්‍යරාජයා වෙත ගිය පැරණි මාර්ගය අසල විශාල ගල් පර්වතයක් සමීපයෙහි චෛත්‍ය ගල නමින් හඳුවන්නු ලබන නිදන් හොරුන් විසින් සාරා ඇති අඩි 30 ක් පමණ උස ගර්භ දෙකක් සහිත ශෛලමය ප්‍රාකාරයකින් වටවූ දාගැබකි. දැනට ගල් කණු 14 ක් පමණ දක්නට ඇති මතු පිට පෙනෙන ගරා වැටුනු ගොඩනැගිලි කීපයක හා විශාල භූමි ප්‍රදේශයක පැතිරී ගිය නටඹුන් දක්නට ඇත.

4. ඉහත සෑයේ සිට කිලෝමීටර එක හමාරකට පමණ දුරින් නිදන් හොරුන් විසින් සාරන ලද මධ්‍යම ප්‍රමාණයේ චෛත්‍යයක් හා ප්‍රාකාර බැම් සහිත සිය ගණනක් ගල් කුළුණු වලින් සමන්විත විහාර සංකීර්ණයකි.

මෙම ස්ථාන සොයා ගැනීම සඳහා හිඟුරක්ගොඩ 7 කණුව ශ්‍රී බෝධිරාජාමාධිපති ලිඳකුඹුරේ ශ්‍රී සොභිතාභිධාන පොළොන්නරුව, තමන්කඩුව දෙපලාතේ උප ප්‍රධාන සංඝනායක ස්වාමීන්ද්‍රයාණන් වහන්සේ, පුලතිස්ගම 400 ශාක්‍යාබිම්බාරාමාධිපති යටිහෙලගල උපතිස්ස හිමියන් හා එම ශිෂ්‍ය පිරිස, 400 පැරකුම්බා පරිවේණාධ්‍යක්ෂ හබරණ රතනධම්ම හිමියන්, සංඝබෝධිගම, ගල්කැටිදමන, ස්ථානයන්හි පොලිස් නිලධාරීන් හා ග්‍රාමාරක්ෂක නිළධාරීන්ද දේවාල ගොඩැල්ලේ සිට පැමිණි සෝමවතී වෙළඳ සංකීර්ණයේ වෙළඳ මහතුන්ද සෝමවතී පොලිස් මුරපොළේ සැරයන් රත්නායක හා කුණ්ඩල හෙට්ටිආරච්චි රාළහාමි යන නිළධාරීන් ද සෝමවතී විහාරාධිවාසී තල්ගොඩ පිටියේ ඉන්දගුත්ත, තලාවේ චන්දසිරි, තළාකොළවැවේ මේධානන්ද යන හිමිවරු, රියදුරු සුගත් මහතා ඇතුළු පිරිසක් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ නිලධාරීන්ද මෙම ස්ථාන ගවේෂණය සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පුරා විද්‍යා අංශාධිපති මහාචාර්ය සුදර්ශන සෙනෙවිරත්න මැතිතුමන්ගේ අධීක්ෂණය හා මෙහෙයවීම අනුව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පුරා විද්‍යා අංශයේ

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය පියතිස්ස සේනානායක, සහකාර කථිකාචාර්ය විරාජ් නිරංජන් බාලසූරිය, තුසිත අගලවත්ත හා සිව්වන වසරේ මනුර ජයසුන්දර යන මහතුන්ගේ පූර්ණ සහයෝගය ලැබුණු බව මෙහිදී කෘතඥතා පරටුව සිහිපත් කරමි.

# මැදගාලාව ප්‍රදේශය

05. සෝමවතී චෛත්‍යස්ථානයට කිලෝමීටර් 3 ක් පමණ දුරින් සෝමවතී ප්‍රධාන මාර්ගයේ සිට උතුරට යාර සියයක් පමණ ඈතින් පැරණි මහවැලි ගඟ අසබඩ දකුණු දෙසට අඩි 20 ක් පමණ උසට ගර්භ දෙකකින් යුක්තව නිදන් හොරුන් විසින් සාරා ඇති චෛත්‍යයකි.

06. උක්ත මැදගාලා ප්‍රදේශයේ ගර්භ දෙකකින් යුක්ත චෛත්‍යරාජයාගේ සිට උතුරු පැත්තට මීටර් 100 ක් පමණ ඈතින් ඩෝසරයකින් මෙන් විශාල ප්‍රදේශයක් කඩා ඇතුලට සාරන ලද සුවිශාල චෛත්‍යයක නටබුන් හා ඒ අවට ගල් කුළුණු විසි එකක් හා ගල් කුළුණු 7 ක් සහිත ගොඩනැගිලි 2 ක නටබුන් දැකීමට හැකිවිය. (මැදගාලා භූමි ප්‍රදේශය)

07. සෝමවතී චෛත්‍යරාජයාගේ සිට සුංගාවිල දක්වා පැමිණෙන මාර්ගයේ කි.මීටර් 3 1/2 ක් පමණ දුරින් වම් පැත්තට හෙවත් ඉපැරණි මහවැලි ගංඉවුරේ වම් පසින් යාර 200 ක් පමණ ඈතින් සුවිශාල බුද්ධ ප්‍රතිමා දෙකක් කෑලි වලට (පාද හා අත් කෑලිවලටත්, බඩ මැදින් බෙල්ල ප්‍රදේශය හා ඇස් ලඟින්ද) කෑලි 12 ක් පමණ කඩා දැමූ අඩි 4 ක් පමණ උස ඉපැරණි සමාධි බුද්ධ ප්‍රතිමාවක් හා ඒ අසල කෑලි වලට කඩන ලද තවත් පිළිමයක් (එම සමාධි පිළිමයේ හිස මා විසින් ගෙනවුත් සෝමවතී චෛත්‍යස්ථානයේ දැක බලාගත හැකි අයුරින් තබා ඇත.) ඒ අසල විනාශ කරන ලද විහාරමන්දිරය, බෝධිප්‍රාකාර ඇතුළු පැන් පොකුණු ප්‍රාකාර ආදියෙන් යුක්ත විහාර සංකීර්ණයකි. (මැද ගාලාව භූමි ප්‍රදේශය)

08. එම විහාර සංකීර්ණයේ සිට කිලෝ මීටර් 1 ට පමණ ඈතින් නිදන් සොරුන් විසින් සාරණ ලද චෛත්‍යයක නටබුන් හා අඩි 4 ක් පමණ දැනට උසින් දක්නට ලැබෙන කණු 25 ක් මත සාදන ලද ටැම්පිට විහාරයක නටබුන් හමුවිය. (මැදගාලාව භූමි ප්‍රදේශය - පුල්ලයාර් පට්ටිය)



09. සුංගාවිල පාලමේ සිට සෝමවති චෛත්‍යරාජයා දෙසට ගමන් කිරීමේදී කි.මී 1 කින් පමණ හමුවන 1 පාලම හා දෙවන ඊරියවල පාලම අතර මාර්ගයේ වමට මීටර් 600 ක් පමණ දුරින් නිදන් හොරුන් විසින් සාරණ ලද චෛත්‍යයක් හා කෑලිවලට කඩන ලද හිටි පිළිමයක් සහිත ගල් කුළුණු සහිත ඉපැරණි විහාර මන්දිරයක නටඹුන් හා ඒ වටා විහාර මන්දිර ගණනාවක නටඹුන්, ඒ වටා විශාල කලුගල් ප්‍රාකාරයකින් සමන්විත විහාර සංකීර්ණයක නටඹුන් හමුවිය. (ඊරියාවල භූමි ප්‍රදේශය)

10. එම විහාර සංකීර්ණයේ සිට සෝමවතී චෛත්‍යරාජයා දෙසට කිලෝ මීටර් 4 ක් පමණ හා ප්‍රධාන මාර්ගයේ සිට කි.මී. 1 ට පමණ ඈතින් මාර්ගයේ වම් පස නිදන් හොරුන් විසින් සාරන ලද චෛත්‍යයක නටඹුන් හා ගල් කුළුණු හා ප්‍රාකාර බැම්වලින් සමන්විත විහාර සංකීර්ණයකි. (පොට්ටු අම්මාගේ ඔරුව කපාපු තොට)

11. එම විහාර සංකීර්ණයේ සිට කි.මී. 5 කට පමණ දුරින් ප්‍රධාන මාර්ගයේ සිට කි.මී. 1 ට පමණ වම් ප්‍රදේශයේ නිදන් සොරුන් විසින් සාරන ලද චෛත්‍ය කීපයක් හා විහාර සංකීර්ණයක නටඹුන් හමුවිය.

12. එම විහාර සංකීර්ණයේ සිට කි.මි. 3 කට පමණ ඈතින් සෝමවති චෛත්‍ය රාජයාට බස්නාහිරින් කි.මී. 1 1/2 කට පමණ දුරින් ද එවැනිම සාරණ ලද චෛත්‍යයක් සහිත ගල් කුළුණු වලින් හා ප්‍රාකාර බැම් වලින් සමන්විත විහාර සංකීර්ණයක් හමුවිය.

13. සෝමවතී චෛත්‍යරාජයාට නැගෙනහිරින් මහවැලි ගඟින් එගොඩ කන්දකඩුව නම් කඳු ගැටයක් සහිත සුවිශාල ගල් පර්වතයක් මත නිදන් හොරුන් විසින් සාරන ලද චෛත්‍යයක් සහිත දර්ශනීය ලෙස කපන ලද ගල්පඩි හා ගොඩනැගිලි, පැන් පොකුණු, ගල්ලෙන් වලින් හා මනහර ගල් තලාවකින් සමන්විත සිරස කඩා දමා ඇති බුද්ධ ප්‍රතිමාවක් සහිත සුවිශාල විහාර සංකීර්ණයකි. එම ස්ථානයෙහි දැනට මහවැලි ගඟ හරහා පාලමක් ඉදි කිරීමත් ගඟ සමීපයේ ශ්‍රී ලංකා මහ බැංකුව මගින් තෙමහල් ගොඩනැගිලි දෙකක් ඉදිකරමින් පවතී.

මෙවැනි ස්ථාන 17 න් මුල් නටඹුන් ස්ථාන 3 හැරුණු කොට සෙසු ස්ථාන 13 ට (නිදන් හොරුන් ආදීන් හැර) පොළොන්නරු යුගයෙන් පසු ගිය පළමුවන භික්ෂූන් වහන්සේ වන මමත් මා සමග සම්බන්ධ වූ අප

ශිෂ්‍ය සෝමවතී රජමහා විහාරාධිවාසි තල්ගොඩපිටියේ ඉන්දගුත්ත හිමි, තලාකොළවැවේ මේධානන්ද හිමි, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ආචාර්ය පියතිස්ස සේනානායක, කථිකාචාර්ය සී.බී. අඹන්වල හා කථිකාචාර්ය ඉසංක මල්සිරි යන අචාර්යවරුන් සමග 2005/2006 අධ්‍යයන 3 වන වසරේ මැද මහනුවර ධම්මසිරි හිමි, ජේ.පී.කේ. ජයරත්න, බී.ඒ. සුදේශ්, යූ.එස්.වයි. අමිල මහේෂ්, එස්.එස්. ප්‍රියලංකා, බන්දුල විජයරත්න කුමාර යන ශිෂ්‍යයන්, කේ.ඇම්.සී. තරංගනී, එච්.එම්.ඩී. සුරංගිකා, ඩබ්ලිව්.පී. ක්‍රිෂාන්ති, එස්.වී. මාතර හේවගේ, පී.ඩබ්ලිව්.ඩී.ටී. විජේසිංහ යන ශිෂ්‍යාවන් හා පොලිසියේ හා යුධහමුදා නිළධාරීන්, මෙහිලා සිහිපත් කරන අතරම මෙම සියළු ස්ථානවලට යාම සඳහා මාර්ගය පෙන්වමින් අප කැටුව ගිය සුංගාවිල මොහොදින් බාව නම් සැදැහැවත් මුස්ලිම් මහතා කෘතවේදීව සිහිපත් කරමි.

14. හන්දකඩුව හා කුම්භනාච්චි මුරපොළ යුධහමුදා නිළධාරීන් සමග නැවතත් උක්ත පිරිස් හා කුම්භනාච්චි හෙවත් රුහුණු සෝමවතියැයි හඳුන්වන ස්ථානයට සෝමවතී චෛත්‍යරාජයාගේ සිට කි.මී. 20 ක පමණ දුරින් නැගෙනහිර දෙසට මහවැලිගඟ ඔස්සේ ගොස් දකුණට හැරී ගියෙමු.

එහි ගල්පර්වතය මත නිදන් හොරුන් විසින් විනාශ කරණ ලද කුඩා චෛත්‍යයක නටඹුන් හා ඒ සමගම ඉපැරණි ගොඩනැගිලි කීපයක නටඹුන් හා ගලින් සෑදු පඩිපෙළ කීපයක් දක්නට ලැබුණු අතර එම පර්වතය යට, ගල් ලෙන සම්බන්ධ කොට නූතන ගඩොලින් සාදන ලද සංඝාවාසයක කුටි කිපයක් ගරා වැටී ඇති බව පෙනේ. එම ස්ථානයේ වැඩ විසූ භික්ෂූන් වහන්සේලා 7 නමක් හා සැදැහැවතුන් 21 දෙනෙක් පමණ 1987 දී ත්‍රස්තවාදීන් විසින් ඝාතනය කළ බව පැවසේ. එම වෙඩි පහරවල් පවා මෙම ස්ථානයේ දක්නට ලැබේ. ඒ ඉදිරි පස මල් ආසනයක නටඹුන් හා එහි ගල්තලාවක් මත කඩා දමන ලද කුඩා බෝධිසත්ව ප්‍රතිමාවක් සේ සැලකිය හැකි අඩි 3 1/2 ක් පමණ හිස හා අත් රහිත පිළිරුවක් උඩබැලි අතට තබා ඇත. එම පර්වතයට නැගෙණහිර දෙසින් තැනිතලා භූමි ප්‍රදේශයක ගොඩනැගිලි කීපයක නටඹුන් හා බිමටම සමතලා කරන ලද කුඩා චෛත්‍යයක නටඹුන් සහිත එහි අඟල් 8 ක් පමණ විශ්කම්භය ඇති අඩි 7 ක් පමණ දිග යූ පගල හෙවත් හර්මිකාව දක්නට ලැබේ. ඒ සමීපයේ 1939 දී පමණ (ගලින් හා සිමෙන්තියෙන්) සාදන ලද ගැඹුරු ලිඳක්ද දක්නට ඇත. (එහි වර්ෂයද කොටා ඇත.)



15-16. මෙම කුම්භනොච්චිය හෙවත් රුහුණු සෝමවති නම් ස්ථනයට යන අතර මග නිදන් සොරුන් විසින් සාරණ ලද චෛත්‍ය සහිත නටඹුන් වලින් සමන්විත ස්ථාන 2 ක් හමුවිය.

17. මගේ ද මග පෙන්වීම අනුව පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ පුරාවිද්‍යා විශේෂවේදී මැදමහනුවර ධම්මසිරි හිමියන් සුංගාවිල මොහොදින් බාවා නම් මුස්ලිම් ජාතික මහතා හා යුධ හමුදාවේ පොලිසියේ හා සිවිල් ආරක්ෂක බලකායේ කීප දෙනෙකු සමග සෝමවතී චෛත්‍යරාජයාගේ සිට කි.මී. 2 ක් පමණ බටහිර දෙසින් පිහිටි කණු පාදන් ගල් 10 කින් යුත් ගොඩැල්ලක් හා ඊට මී. 30 ක් පමණ නැගෙනහිර දෙසින් නිදන් සොරුන් විසින් මීටර් 2 ක් පමණ යටට සාරණ ලද වලක් සහිත චෛත්‍යයක්ද ගඩොලින් කරණ ලද ප්‍රාකාරයක නටඹුන් හා විශාල ප්‍රමාණයේ ගල් කණු සහිත ශාලාවකින් ද එම ගොඩනැගිල්ලේ සිට මීටර් 10 කට බටහිර දෙසින් මීටර් 3 ක් පමණ උසැති ගල් කුළුණු සහිත ශාලාවක නටඹුන් ද එහි සිට මීටර් 500 ක් පමණ බටහිර දෙසින් මැටිබදුන් පැතුරුණු උස් ගොඩැල්ලක් ද එහි දකුණු දෙසින් ගල් කණු 8 ක් සහිත ගොඩැල්ලක්ද මේ සියළු නටඹුන් වටා ගඩොල් බැම්මකින් සමන්විත දැනට දේවද චේතිය නමින් හඳුන්වන විහාර සංකීර්ණයක් සොයා ගන්නා ලදී.

18. මෙම දේවදචේතිය නම් ස්ථානයේ සිට මීටර් 700 ක් පමණ බටහිර දෙසින් අඩි 5 ක් පමණ උසැති එක් ගල් කුළුණකින් සමන්විත උස් භූමියක්ද, ඊට මීටර් 30 ක් උතුරු දෙසින් ගල්කුළුණු 24 ක ගොඩනැගිල්ලක්ද එයට දකුණු පැත්තෙන් ගල් කණු 6 ක කුඩා ගොඩනැගිල්ලක්ද එතැන්සිට මීටර් 200 ක් පමණ දකුණින් වෘත්තාකාරව ගල් කුට්ටි යොදා සකස් කළ ගොඩැල්ලක නටඹුන් ද මෙම ගොඩනැගිල්ලට උතුරු පැත්තේ විශාල යබර කුට්ටි සහිත ගල්කණු 6 කින් යුත් ගොඩැල්ලක් සහිත යකඩ නිෂ්පාදනය හා සම්බන්ධ ස්ථානයක් වූ වසර 2000 ක් පමණ ඉපැරණි මෙම ප්‍රදේශය නුගතලවැට නමින් හඳුන්වති.

19. සෝමවති චෛත්‍යරාජයාගේ සිට සුංගාවිල දක්වා දිවෙන ප්‍රධාන මාර්ගයේ කි.මී. 5 ක් පමණ පැමිණ වමට හැරී කි.මී. 1 ක් පමණ නැගෙනහිරට ගියවිට සුංගාවිල පැත්තට ගලා බසින ඇලෙන් එතරවී.මී. 100 ක් නැගෙනහිර දෙසට ගිය පසු ගල් කුළුණු 8 කින් සමන්විතව ගොඩනැගිල්ලක නටඹුන් හා එයින් දකුණු පස ඇලට සේදී යන කුඩා

ප්‍රමාණයේ චෛත්‍යයක නටඹුන් හා ඒ අවට උළු, වලන් කැබලි හමුවිය. මේ ප්‍රදේශය ගල්කණුවාන නමින් හඳුන්වති.

20. කන්දකාඩු ගල් පර්වතයේ සිට කි.මී. 2 ක් පමණ දකුණු දෙසට ගමන් කරණ විට විශාල ගල් පර්වතයක් මත 11 වන සියවසට පමණ අයත් විශාල වශයෙන් හානි වී ඇති පේළි හතකින් පමණ සමන්විත අඩි 5 ක් පමණ දිග හා අඩි 4 ක් පමණ පළලැති පර්වත ලිපියක් සහිත අර්ධ වශයෙන් කැටයම් කළ සිරිපතුල් 2 කි.

21. කන්දකඩුවේ සිට උතුරු දෙස කි.මී. 14 ක් පමණ දුරින් මල්වත්ත විල්ලුව හරහා මාවිල් ආරුවට වැටෙන විශාල ඇල මාර්ගයක බටහිර ඉවුරේ සිට මීටර් 100 ක් පමණ තැලේ ඇතුළට පිවිසෙන විට හාරණ ලද චෛත්‍යයක් හා අඩි 7 ක් පමණ උසැති ගල් කණු කීපයකින් සමන්විත ගොඩනැගිල්ලක නටඹුන් හා විශාල ගල් ආසනයක්ද, හිස නැති අඩි 12 ක් පමණ උස (අවුකන බුද්ධ ප්‍රතිමාවට සමාන) හිටි බුද්ධ ප්‍රතිමාවකි. එම පිළිමය වටා ප්‍රතිමා ගෘහයකට සමාන ගල් කණු නටඹුන් සහිත භූමි ප්‍රදේශයක් දක්නට ඇත.

මේ අයුරින් දැනට සෝමවතී චෛත්‍යරාජයා වටා කි.මීටර් කීපයකට සම්පව නටඹුන් සහිත ස්ථාන 21 කට වඩා සොයා ගැනීමට හැකි වූ අතර තව සිය ගණනක් මෙවන් නටඹුන් වූ ස්ථාන සොයා ගැනීමට හැකි හෙයින් එම ස්ථාන සොයා ගෙන පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් ඒවා සංරක්‍ෂණය කොට මහජනතාවට දැක බලා ගැනීමට සැලැස්විය යුතු සුදුසු කාලය උදාවී ඇති බව මෙහිදී සිහිපත් කළ යුතුය.

ත්‍රස්තවාදී උවදුරු හා භීෂණය නිසා සෝමවතී චෛත්‍ය ස්ථානය වෙත යෑම පවා අපමණ භීතියට පත්ව, ජීවිතය පිළිබඳවුද සැක කටයුතු කාලයක මෙම ස්ථාන 21 ක පුරාවිද්‍යා නෂ්ටාවශේෂ සොයා ගැනීමට මට සහාය වූ මුලින් නම් සඳහන් කළ පිරිස අතර පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආචාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයන් අතරින් වසර 3 ක් මුළුල්ලෙහි මෙම සියළු ස්ථාන දැක බලා ගැනීමෙන් හා අධ්‍යයනය කිරීමෙන් සෝමවතී චෛත්‍යස්ථානය හා එම ප්‍රදේශයේ වටිනාකම මැනවින් අවබෝධ කරගත් මැදමහනුවර ධම්මසිරි ශිෂ්‍ය හිමියන් ඉතා දුෂ්කරතා මධ්‍යයේ සොයාගත් උසස් දැනුම් සම්භාරය 2008/2009 වසරේ "පුරාවිද්‍යා විශේෂවේදී අවසාන ස්වාධීන නිබන්ධනය" ලෙස ඉදිරිපත් කරමින් පුරාවිද්‍යා අංශාධිපති තුමා



ප්‍රධාන ආචාර්ය මණ්ඩලයේ ආශිර්වාදාත්මක සම්භාවනාවට පාත්‍ර වූ අතර "සෝමවතිය ස්තූපය හා ඒ ආශ්‍රිත ප්‍රදේශය පිළිබඳව පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්" යන මැයෙන් ඔබ අප අතට පත්කර ඇති එම ග්‍රන්ථය පිළිබඳව ග්‍රන්ථය සැකසූ අපේ මල්වතු මහා විහාරයේ වැලිවිට සංඝරාජාරාමාධිවාසී ගෞරව ශාස්ත්‍රවේදී මැදමහනුවර ධම්මසිරි ශිෂ්‍ය හිමියනට ශ්‍රී දකුණු දළදා සමිඳුගේ ආශිර්වාදය මෙයින් පළකරමු.

ත්‍රස්තවාදී උවදුරු නිසා වසර 17 ක් පමණ කාලයක් මුළුල්ලෙහි වල් බිහිව තිබී නැවත එළිපෙහෙළි කිරීමෙන් පසු පොළොව මතුපිටින් දක්නට ඇති නටඹුන් අනුව දිගින් අඩි 100 ක් හා පළලින් අඩි 40 ක් පමණ වූ මණිඅගිය පොහොය සීමාවද, සෝම නම් පස් පිළිම විහාරයක්ද, චෛත්‍යරාජයා වටා ප්‍රධාන ආරක්‍ෂක විහාර 4 ක් හා දකුණු පසින් ඇතුල් මළුවේ ප්‍රධාන විහාරය යන විහාර 5 ක්ද ඒ වටා විහාර 8 ක් ද යන ආරක්‍ෂක විහාර 13 කින් ආරක්‍ෂාව යොදා ඒ වටා ප්‍රාකාර බැම්ම සහිත වාහල්කඩ 4 කින්ද සමන්විත වී ඇති අතර චෛත්‍යරාජයාට නැගෙණහිර පැත්තෙන් අඩි 1000 ක්ද උතුර - දකුණ හා බටහිර දෙසින් අඩි 600 ක් දක්වා පොළොවේ ගඩොල් අතුරන ලද සලපතල මළුවකින් යුක්තව දිය අගලින් හා පොකුණුවලින් සමන්විතව ඇති බව පුරාවිද්‍යා කැණීම් වලින්ද හෙළිවේ.

ප්‍රාකාර බැම්මෙන් පිටත නැගෙණහිර පැත්තෙන් සංඝාවාස සංකීර්ණයක නටඹුන් දැනට මතුවී ඇති බව පැහැදිලිව පෙනෙන හෙයින් මේවා පිළිබඳව ස්ථිර නිගමනයකට පත්වීම සඳහා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අධීක්‍ෂණය හා මග පෙන්වීම යටතේ කැනීම් හා සංරක්‍ෂණ කටයුතු හැකි කඩිනමින් කර ගැනීමට මෙරට හෝ විදේශ වලින් ආධාර ලබාගෙන අපගේ ජාතික, ආගමික, සංස්කෘතික උරුමයන් හා අනන්‍යතාවය පෙන්විය හැකි මෙම ජාතික ස්මාරකය මතුකර, සංරක්‍ෂණය කර ගැනිම සඳහා වගකිව යුතු ඔබ සැමගේ කාරුණික අවධානය යොමුවේවා.

2002 ජූනි 24 දින කොත් පැළඳවීමේ උත්සවයේ පටන් මෙතෙක් චෛත්‍යස්ථානයේ අභිවෘද්ධිය ප්‍රාර්ථනය කරමින් කටයුතු කරමින් චෛත්‍යරාජයාගේ සුනු ආලේප කළද, ග්‍රීෂ්මයෙන් හා පිපාසිතව වන්දනාව සඳහා පැමිණෙන සැදැහැවතුන්ගේ ප්‍රයෝජනය සඳහා ජලය සීතල කිරීමේ යන්ත්‍රයක් සවිකළ පානදුරේ නිව් නන්දන කන්ට්‍රක්ෂන් අධිපති කුරුප්පුමුල්ලේ

ජගත් නන්දන මැතිතුමා හා මැතිණිය, සූර්ය තාපය මගින් දිවා රෑ විදුලි ආලෝකය ලබා දුන් ඩී.එෆ්.සී.සී. බැංකුමේ ප්‍රධාන විධායක නිළධාරි නිහාල් ෆොන්සේකා මහතා ජ්‍යෙෂ්ඨ විධායක උපසභාපති එල්.පී. පෙරේරා මහතා, උපසභාපති ප්‍රසන්න ප්‍රේමරත්න මහතා ඇතුළු එම බැංකුවේ කාර්ය මණ්ඩලයටත්,

නිවාස හා යටිතල පහසුකම් අමාත්‍ය ආරුමුගන් තොණ්ඩමන් මැතිතුමා ප්‍රධාන ලේකම් ඩබ්ලිව්.ඩී. අයිලප්පෙරුම මැතිතුමා, නිවාස සංවර්ධන අධිකාරියේ සභාපති සරත් මුණසිංහ මහතා, සාමාන්‍යාධිකාරි පියල් ගනේපොල මහතා, අලියෙක් පැමිණ දකුණු අත හා සොඬ ඔසවා චෛත්‍යරාජ්‍යා වන්දනාකරනු දැක අපමණ සතුටට පත්ව පසුදින 2003 ජූලි 13 ඇසළ පොහෝදින දෙමළ, කතෝලික භක්තිකයෙක් වුවද විදුලි වැඩ මූලික එච්. කුමාරවේල් මහතා සියැසින්ම දැක පෙන්වන ලදුව බුදුරැස් දකිමින් බුද්ධාලම්භන ප්‍රීතියෙන් අපමණ සතුටට පත්වූ ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ඉංජිනේරු හෙක්ටර් විජේසේකර මහතා ඇතුළු එම කාර්ය මණ්ඩලයටත්, කටුකැලේ ලේඩි බ්ලේක් ආරාමාධිපතිනි, කොත්මලේ සුධර්මා දස සිල් මෑණියන්ටත්, සිරිමල්වත්ත අමුණුගම උඩ ගුන්නෑපාන සංඝමිත්තා ආරාමාධිපතිනිය ඇතුළු දසසිල් මෑණිවරුන්ටත්, කළුබෝවිල සේනවීර මැතිතුමා හා රංජිත් අමිතා සේනවීර මැතිණියටත්, ලක්‍ෂ සංඛ්‍යාත සැදැහැවතුන් පමුණුවමින් 2003.08.11 දින නව අරහාදි පහන් පූජාව සහ බුදුගුණ භාවනාව මෙහෙය වූ සාම විනිසුරු ධර්මාචාර්‍ය කේ. පරණවිතාන මැතිතුමාටත් එම සියළු සංවිධාන කටයුතු සිදුකළ පානදුරේ චිත්‍රා ජයනෙත්ති හා මහේශ්වරි හා බලංගොඩ ශ්‍රියානි ඩයස් මැතිණියටත්, ගංගොඩවිල පී.එච්.එම් ද සිල්වා මැතිතුමා හා මැතිණියටත්, මහනුවර ලංකා බැංකුවේ නියෝජ්‍ය මහ කළමනාකාර ජයසුන්දර මැතිතුමා ඇතුළු එම කාර්‍ය මණ්ඩලයටත්, මෙම ග්‍රන්ථයේ පිට කවරය මැනවින් සකස් කර අනුග්‍රහය දැක්වූ මාලිගාකන්ද පාරේ සමයවර්ධන මුද්‍රණාලයාධිපති ආරියදාස වීරමන් මැතිතුමා ඇතුළු එම කාර්ය මණ්ඩලයටත්, චිරජීවනයත් දකුණු දළදා සමිඳු සරණත් ප්‍රාර්ථනය කරමු.



# 2002 ජූනි 24 දින සිට 2010 ජූනි 30 දක්වා සෝමවති චෛත්‍යයේ සංවර්ධන කටයුතු

රා.ව. 2002 ජූනි 24 පොසොන් පුර පසළොස්වක පොහෝ දින චූඩා මාණික්‍ය පැළඳවීම උත්සවයෙන් පසු වාර්ෂික සෝමවතී චෛත්‍යරාජ්‍යා ඇතුළු පුදබිම ගංවතුරෙන් යට වුවත්, ත්‍රස්තවාදි උවදුරු මධ්‍යයේ නමුත් පොලිසිය හා යුධ හමුදා ආරක්ෂා මධ්‍යයේ රජයේ හා සැදැහැවතුන්ගේ ආධාර නිසාම යෝමවතී චෛත්‍යස්ථානය මෙවන් තත්වයකට පත්කර ගැනීමට හැකිවූ බව කෘතඥතා පූර්වකව ශ්‍රී දළදා සමිඳුගේ ආශිර්වාදය ප්‍රාර්ථනය කරමින් පළමුව සිහිපත් කරමි.

1. වාර්ෂිකව ගංවතුරෙන් යටවන මළුව හා සෝමවතී පුදබිම් ප්‍රදේශය සුරක්ෂිත කර ගනිමින් භික්ෂුන් වහන්සේගේ හා නේවාසිකයන්ගේ පහසුව සඳහා 2002 මාර්තු 16 දින ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර 27 දින පදිංචි වූ දැනට පවත්නා තාවකාලික සංඝාවාස ගොඩනැගිල්ල සුදුසු සේ සකස් කර ගැනීම.

2. ශ්‍රී දකුණු දළදා වහන්සේගේ හා ඉබේ හටගත් අශද්‍රෘශ බෝධීන් වහන්සේ උදෙසා දිනපතා පවත්වනු ලබන මහා මුළුතැන් දළදා බුද්ධ පූජාව සකස් කිරීම සඳහා තාවකාලික මුළුතැන් ගෙය 1981 දී සෝමවතී චෛත්‍යරාජයාගේ කොත් පැළඳවූ දිනයේ බුද්ධ රශ්මි මාලාව සියැසින් දැක අපමණ සතුටට පත්ව සිටි නිලිනා සුමතිපාල මැතිණිය හා ඩී.පී. අලහකෝන් මැතිණිය ආදී සැදැහැවතුන්ගේ ආධාරයෙන් ඉදිකිරීම.

3. චෛත්‍යරාජ්‍යාට උතුරු දෙසින් ආසනය සහිත අඩි 7 ක් උසැති දර්ශනීය බුද්ධ ප්‍රතිමා වහන්සේ බුදුරැස් මධ්‍යයේ කොස්ගොඩ වෛද්‍ය සමන් කන්කානම් මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් තැන්පත් කිරීම.

4. ඉබේම හටගත් අසද්‍රෘශ බෝධිරාජයාණන් වහන්සේ වටා දර්ශනීය ඇතුල් ආරක්ෂිත වැට පිළියන්දල නාමල් ට්‍රේඩර්ස් අධිපති යූ.ඩී. කරුණාරත්න මහතා විසින් සෑදවීම.